මගේ අංකය :- SP-PSC/32/LI/04/02
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව- දකුණු පළාත,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
කළුවැල්ල, ගාල්ල.
2024.08.30

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා / සැලසුම් හා මෙහෙයුම්),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දකුණු පළාත.

## දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024

## Limited Competitive Examination for Recruitment to the Posts of Management Services Officers Grade III in Southern Province-2024

1.0 අංක 192 හා 2014.09.11 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2017.11.28, 2018.11.02, 2020.02.25 හා 2021.02.22 දිනැතිව සංශෝධිත දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ 1 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුව 2024.09.01 දිනට දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු අතුරෙන් 30% ක් සම්පූර්ණ කිරීම සඳහා දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද හා මධ්‍ය රජයෙන් / වෙනත් පළාත් සභාවලින් දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. 2024.09.01 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 191 කි. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2024.09.24 දින වන අතර මෙම විභාගය 2024 නොවැම්බර් මස පවත්වනු ලබයි.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරණ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-01-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් උසස් කිරීම මඟින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් **30%** ක් පමණක් මෙම විභාගයේ ප්‍රතිඵල අනුව සම්පූර්ණ කරනු ලැබේ.

3.0 වැටුප :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III/II/I ශ්‍රේණියට අදාල වැටුප් කාණ්ඩය MN-02-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 28,940 – 10x300 - 11x350 - 10x560- 10x660 - රු. 47,990 ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

සටහන :- පත්වීම් ලබන අවධියේ ක්‍රියාවේ යොදන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත් ව, වැටුප් වැඩිවීමේ වාසි ලබාදෙනු ලැබේ.

4.0 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. එසේ වුවද, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ ව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

5.0 **යෝග්‍යතාව :-** සීමිත පදනමින් දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම සම්පූර්ණ කළ යුතු වේ.

(i) දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරණ එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් සහ MN-01-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතු ය.

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් **2024.09.24** දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

❖ **අධ්‍යාපන සුදුසුකම් :-** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිත ව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය / අංක ගණිතය / ශුද්ධ ගණිතය / මූලික ගණිතය / වාණිජ අංක ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) සමත් ව තිබීම.

❖ **පළපුරුද්ද :-** නියමිත දිනට දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට තිබිය යුතුය. ( යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.)

## 6.0 විභාග පරිපාටිය :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| විභාගය | විෂයය | කාලය | ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| සීමිත | භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි යෝග්‍යතා පරීක්ෂණය | පැය 02 1/2 යි | 100 යි | 40 |
| සීමිත | අභියෝග්‍යතාවය | පැය 01 යි | 100 යි | 40 |

ඉහත විෂයයන්ට අදාළ විෂයය නිර්දේශ පහත පරිදි වේ.

- **<u>භාෂා හැකියාව හා කළමනාකරණ සේවා නිලධාරි යෝග්‍යතා පරීක්ෂණය</u>** - මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් ද,
කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සේවා නිලධරයෙකු විසින් කටයුතු කළ යුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියා කරන ආකාරය ආදී කළමනාකරණ සේවා නිලධරයෙකුගේ රාජකාරි පිළිබඳ අපේක්ෂක / අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න පත්‍රවලින් ද කාර්යාලයක ප්‍රයෝජනයට ගනු ලබන ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අපේක්ෂක / අපේක්ෂිකාවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින් ද සමන්විත වේ.

- **අභියෝග්‍යතාවය** - මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත වේ.

  (අපේක්ෂකයන්ගේ රාජකාරි කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

  පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙන් 40% ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලකුණු ලබා ගත යුතුය. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම නොපැහැදිලි අත්අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලකුණු ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් ලකුණු අනුපිළිවෙළ තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

7.0 **විභාග ප්‍රතිඵල :-** දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත තැපැල් මඟින් හා සියලුම අයදුම්කරුවන් වෙත මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

8.0 **විභාග ගාස්තු :-**

විභාග ගාස්තුව රු. 600/- කි. මාර්ගගත ව (Online) විභාග ගාස්තු ගෙවිය යුතු වේ.

සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA හෝ MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිදු ආකාරයකින් පිළිගනු නොලැබේ. කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

9.0 **විභාගය පැවැත්වීමට යෝජිත නගර :-**

විභාග මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජිත නගරයන් පහත පරිදිය. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය ආසන්නතම නගරයේදී පවත්වනු ඇත. අයදුම්කරුවන් නගරය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරු ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ පහත සඳහන් නගරයක් පමණි.

| | **ගාල්ල දිස්ත්‍රික්කය** | **මාතර දිස්ත්‍රික්කය** | **හම්බන්තොට දිස්ත්‍රික්කය** |
|---|---|---|---|
| **නගර** | ගාල්ල | මාතර | තංගල්ල |
| | අම්බලන්ගොඩ | අකුරැස්ස | හම්බන්තොට |
| | බද්දේගම | - | - |

10.0 **අයදුම්කළ යුතු පිළිවෙල :-**

සියලුම අයදුම්කරුවන් www.psc.sp.gov.lk යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා යොමු කළ යුතු ය. ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා අදාළ තොරතුරු පරීක්ෂාකර මාර්ගගතව නිර්දේශය ලබා දීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කළ යුතු ව ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව **2024 සැප්තැම්බර් මස 24 වන දින ප.ව. 11.59** න් අවසන් වේ. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.)

10.1 අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම් පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු අතර, කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ අයදුම්පතක් එම නිලධාරියාගේ අනුදැනුමකින් තොරව සම්පූර්ණ නොකළ යුතු ය.

10.2 අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

10.3 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගතව යොමු (Submit) කරන ලද අයදුම්පත බාගත (Download) කර එහි දෘඩ පිටපත (Hard Copy) නිර්දේශ කර මෙම කොමිෂන් සභාව වෙත එවීම සඳහා අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව නඩත්තු වන ආයතනයේ ප්‍රධානියාට භාරදිය යුතු ය.

11.0 **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-**

විභාගය සඳහා අයදුම් කිරීමේ කාලය අවසන් වීමෙන් පසු දින 02ක කාලයක් තුළ එනම්, **2024 සැප්තැම්බර් 27 වන දින ප.ව. 11.59 දක්වා** අයදුම්පත් මාර්ගගතව නිර්දේශ කිරීමේ අවස්ථාව පවතී. ඒ සඳහා අදාළ ආයතනය විසින් නම් කළ මාණ්ඩලික නිලධාරියා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ඇති විභාග අයදුම්පත් නිර්දේශ කිරීමේ කවුළුවට පිවිස (Main menu > Exams > Coordinator Login) අදාළ විභාගය තෝරා තම ආයතනය යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂාකර බලා නිර්දේශ කිරීමේ හැකියාව පවතී.

11.1 අයදුම්කරුවන් විසින් සපයා ඇති සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරු ව අයදුම්පත් නිර්දේශ කළ යුතු අතර, යම් හෙයකින් සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබියදී අයදුම්පත් නිර්දේශ කර ඇත්නම් ඒ පිළිබඳ වගකීම අදාළ මාණ්ඩලික නිලධාරියා විසින් දැරිය යුතු වේ. අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වන අතර, නිර්දේශ නොකරන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු ලෙසකිනුදු නැවත සලකා බැලීමක් සිදු නොකෙරේ.

11.2 නිර්දේශ කිරීමේ කාලසීමාව අවසන් වූ පසු ස්වයංක්‍රීයව එම කවුළුව ක්‍රියා විරහිත වන අතර, නිර්දේශ නොකරන ලද අයදුම්පත් සියල්ල දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වීමකින් තොරව ප්‍රතික්ෂේප වනු ඇත.

11.3 සියළු අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු, අනිවාර්යයෙන් ම එම නිර්දේශිත අයදුම්පත් ලේඛනය එම ස්ථානයෙන්ම බාගත කර මුද්‍රණය කළ යුතු ය.

11.4 එම ලේඛනය සමඟ එම ආයතනය යටතේ අයදුම් කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල දෘඩ පිටපත් ද නිර්දේශ කර එකවර මෙම කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, එම ලේඛන බහා එවන කවරයේ වම් පස **"දකුණු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2024"** යන්න සඳහන් කළ යුතු ය.

12.0 **ප්‍රවේශ පත්‍ර :-**

නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම සීමිත තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඔබ ආයතනයේ සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා වෙත කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර, වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුවට පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකිය.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර, ආයතනයේ ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු මඟින් අත්සන සහතික කරවා විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

13.0 රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයන් අතුරින් ඉහළ ම ලකුණු ලබාගත් 3%ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50%ක් වත් විය යුතු ය. එලෙස තෝරා ගනු ලබන අපේක්ෂකයින් විශේෂඥ වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතු ය. මේ අනුව, ඔබගේ ආබාධිත තත්ත්වය සනාථ කළ හැකි ලිපි අයදුම්පත්‍රයට ඇමිණිය යුතු ය.

13.1 මාර්ගගතව අයදුම්පත් කැඳවන බැවින්, සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

14.0 **සාවද්‍ය තොරතුරු සැපයීම :-** මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. තව ද කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට ආනුෂංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ගාමිණී වීරවික්‍රම
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ගාමිණී වීරවික්‍රම
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

2024 අගෝස්තු මස 30 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(**සැලකිය යුතුයි -** ඔබ ආයතනයට අනුබද්ධ ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු මෙම සීමිත තරග විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් කරුණාකර ඔවුන් දැනුම්වත් කිරීමට කටයුතු කරන්න.)